මාධ්‍ය විසින් සෑම විටකම සාවද්‍ය හෝ නොමඟ යවන සුළු පුවත් වාර්තා නොකිරීමට උත්සාහ ගත යුතු බව, මාධ්‍ය ආචාර ධර්ම තුළින් අවධාරණය කෙරේ. යම් සිදුවීමක සැකකරුවෙකු නිසි නීතිමය ක්‍රියාවලියක් ඔස්සේ වරදකරුවෙකු කිරීමට පෙරාතුව, මාධ්‍ය ඔස්සේ වරදකරුවකු ලෙසින් හැඟවුම් කිරීමද එවැනි නොමඟ යවන සුළු වාර්තාකරණයන්ට අයත් නොවන්නේදැයි පාඨක අප විමසිය යුතුවේ.

උදාහරණයක් ලෙසට, අරුණ පුවත්පතෙහි (ජනවාරි 28, 2022) "ඩස්පි දුවගෙන ගොස් ලෙච්චමී ඝාතකයාගේ ඇඟට පනී" යන සිරස්තලයෙන් යුතුව පළවූ පුවත ගත හැක.

මෙම පුවතෙහි අන්තර්ගතය තුළ දැක්වෙන්නේ, ඩස්පි නම් පොලිස් සුනඛයා "ලෙච්චමී" නම් කාන්තාව ඝාතනය කරන ලද බවට සැක කෙරෙන පුද්ගලයාගේ "නිවසට කඩා වැදුනු" බවයි. නමුත් පුවත් සිරස්තලයෙහි දැක්වෙන්නේ එම සුනඛයා "ඝාතකයාගේ ඇඟට" පැන්න බවයි.

ඔබ සිතනා ලෙසට,
1) සිරස්තලය සහ අන්තර්ගතයෙහි ගැබ් තොරතුරු අතර මෙවැනි පරස්පර විරෝධීතාවයක් ඇති අවස්ථාවන්හි පාඨකයා පිළිගත යුත්තේ කුමන කොටසද?
2) එවැනි පරස්පර විරෝධීතා පාඨකයා නොමඟ යැවීමට හේතු නොවන්නේද?
3) නීතියෙන් යම් අපරාධයකට වරදකරුවෙකු ලෙසින් ඔප්පු වී නොමැති අවස්ථාවන්හි ඔහු/ඇය "ඝාතකයෙකු" ලෙසින් හැඳින්වීම කෙතරම් ආචාර ධාර්මික ද?
4) එමෙන්ම, "දූෂණය" වැනි යෙදුම් ඔස්සේ ලිංගික අපරාධයකට මුහුණ පෑ අයෙකු අපවිත්‍ර වී ඇති බවක් හැඟවෙන හෙයින්, ඒ වෙනුවට "ලිංගික අපරාධය" වැනි යෙදුමක් වඩාත් සුදුසු නොවන්නේ ද?